දම් පාටින්

අභියෝග හමුවේ කාන්තාව

ස්වර්ණකාන්ති රාජපක්ෂ ගේ නවතම පරිවර්තනය

ස්වර්ණකාන්ති රාජපක්ෂ පරිවර්තන කාර්යයේ නියැලෙමින් මේ වන විට සාහිත්‍ය වටිනාකමක් ඇති ගුන්ථ විශාල සංඛ්‍යාවක් සිංහල පාඨකයනට දායාද කර ඇත. ඇය මේ කාර්යය වෙනුවෙන් දෙවරක්ම රාජ්‍ය සාහිත්‍ය සම්මාන දිනා ඇති අතර කීපවරක්ම ඇගේ පරිවර්තන අවසාන විනිශ්චය සඳහා නිර්දේශ වී ඇත .

ස්වර්ණකාන්ති පරිවර්තන කාර්යයට අමතරව ඇගේම ස්වතන්ත්‍ර නිර්මාණ කීපයක් ද පාඨකයාට තිළිණ කර ඇත. ඒ අතරින් නිල් දල්ල මෝරලා දවුල යන නවකතා කැපී පෙනෙයි. 2007 වසරේදී ලියෝ ටොල්ස්ටෝයිගේ ඇනා කැරනිනා කෘතිය පරිවර්තනය කරමින් රාජ්‍ය සාහිත්‍ය සම්මානය දිනාගත් ඇය 2004 වසරේදී කුරුල්ලා සහ තරු මඩල පරිවර්තනය වෙනුවෙන්ද සම්මාන ලබාගත්තාය.

ස්වර්ණකාන්ති ගේ පරිවර්තන කාර්යය තුළ ඇති විශේෂත්වය ලෙස මා දකින්නේ ඉතා සියුම් මට සිලුවූ නිරවුල් ආකාරයට භාෂාව හැසිරවීමට ඇය දක්වන කුසලතාවයි. පාඨකයාට තමා කියවන්නේ පරිවර්තන කෘතියක් යයි නොහැඟවෙන තරම් සාර්ථක ලෙස සිය පරිවර්තනය කරන්නට ඇය සමත්වෙයි.

සිංහලයට පරිවර්තනය කරන ලද කෘති කියවීමට අපට මුල් පෙළඹවීම ලැබුණේ සිරිල් සී පෙරේරා කේ පී කරුණාතිලක දැදිගම වී රුදිගු පද්මහර්ෂ කුරණගේ වැනි කෘතහස්ත පරිවර්තකයන්ගෙනි. අපට දුරස්තව තිබූ විදෙස් සාහිත්‍යය අප අත ළඟට ගෙන එන්නට මේ පරිවර්තකයන් පෑ දස්කම නොවන්නට අප මේ තරම් සාහිත්‍යකාමීන් නොවන්නට ඉඩ තිබුණි. එවන් පරිවර්තකයන් හා සම මට්ටමක සිටින්නට ස්වර්ණකාන්ති රාජපක්ෂ ලේඛිකාව සමත් ඇති බව ඇගේ සියලුම පරිවර්තන කෘති කියවන්නට භාග්‍යය ලද මට සිතෙයි. නූතන සිංහල සාහිත්‍ය ක්ෂෙත්‍රයේ ඉදිරියෙන්ම සිටින පරිවර්තිකාවක බවට පත්වන්නට ඇයට හැකිවන්නේ සිය කාර්යය පිළිබඳ ඇයට ඇති මනා අධ්‍යයනය නිසාය. අද අපට බොහෝ විට කියවන්නට ලැබෙන හරසුන් පරිවර්තන අතර ඇගේ පරිවර්තන කැපී පෙනෙන්නේ එනිසා ය.



ස්වර්ණකාන්ති රාජපක්ෂ ලේඛිකාව සමත් ඇති බව ඇගේ සියලුම පරිවර්තන කෘති කියවන්නට භාග්‍යය ලද මට සිතෙයි.

ස්වර්ණකාන්තිගේ අලුත්ම පරිවර්තනය "දම් පාටින්" ය. මෙය සම්මානනීය ලේඛිකා ඇලිස් වෝකර් ගේ "ද කලර් පර්පල්" කෘතියේ සිංහල පරිවර්තනයයි. ද කලර් පර්පල් කෘතිය ලෝක ප්‍රකට නැෂනල් බුක් අවෝඩ් සම්මානයත් පුලිට්සර් සම්මානයත් දිනාගත් කෘතියකි. එසේම ලෝක ප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂ ස්ටීවන් ස්පිල්බර්ග් ගේ ද කලර් පර්පල් චිත්‍රපයට පාදක වූයේ ද මෙම කෘතියයි. විශ්ව සාහිත්‍යයේ නමක් රැන්දූ මේ කෘතිය සිංහලට පරිවර්තනය කිරීම ස්වර්ණකාන්ති අතින් සිදුවූ විශාල සේවයක් යයි මම සිතමි.

මේ නවකතාවට පාදක වන්නේ වසර හැට හැත්තෑසකට පමණ ඉහතදී ඇමරිකා එක්සත් ජනපදයේ දකුණු කොටසේ ජීවත් වූ කලු ජාතිකයන්ගේ ජීවන රටාව පිළිබඳව හා කලු ජාතික කාන්තාවන්ගේ අතිශය දුශ්‍රකර දිවිපෙවෙතයි. මේ කටුක පරිසරයේදී කාන්තාවන් විශාල ලෙස අපයෝජනයට ලක්වීම කෘතිය තුළ මැනැවින් සාකච්ඡා වී තිබෙනුද අපට පෙනෙයි. කතා නායිකාව සිලී නම් වන කලු ජාතික කාන්තාවයි. ඇය තමා හඳාවඩාගත් පුද්ගලයා අතින් පවා දූෂණයට ලක්වෙයි. සිය වේදනාබර ජීවිතය පිළිබඳව කතා නායිකාව දෙවියන්ට ලියනු ලබන ලිපි මගින් කතාව විකසනය වෙයි. දෙවියන් හා පැවසිය නොහැකි යම් යම් දේ කතාවේ හෙළිදරව් වන්නේ ඇය සිය යෙහෙළියන් හා කරන කතා හරහා ය.

"ආදරණීය දෙයියනේ.. මගේ වයස අවුරුදු දා හතරයි. මම කවදත් හොඳ ළමයෙක්. මට මොනවද මේ සිද්දවෙන්නෙ කියල තේරුම් ගන්නට පුලුවන් විදියේ හෝඩුවාවක් වත් දෙන්න ඔබ වහන්සේට පුලුවන්වේවි කියලා මට හිතෙනවා." සිලී සිය කතාව දෙවියන්ට කියන්නට පටන් ගන්නේ එසේය.

ඇගේ මේ දුක්බර කතාව මනා ලෙස නිර්මාණය කරන්නට ඇලිස් වෝකර් පෙන්වා ඇති දක්ෂතාවට කිසිදු ලෙසකින් හෝ හානියක් නොකර එය සිංහලයට නගන්නට ස්වර්ණකාන්ති සමත්වෙයි. කෘතියේ සමහර තැන් වල දකින්නට ලැබෙන ලිංගිකත්වය පිළිබඳ සඳහන් වන අවස්ථා වලදී පවා මනා සංයමයකින් යුතුව ඒවා පරිවර්තනය කරන්නට පරිවර්තිකාව දක්වන සමත්කම පැසසුම් කටයුතුය.

අප්‍රිකාවේ ගෝත්‍රික සමාජයේ ඇතුලාන්තය පිළිබඳවත් සුදු ජාතිකයන් සිය සුඛසිද්ධිය සඳහා සංවර්ධනයේ නාමයෙන් කරන ආක්‍රමණය හමුවේ අප්‍රිකානුවන් විඳින වේදනාව පිළිබඳවත් කෘතිය තුළ සාකච්ඡාවන්නේ පාඨකයාගේ සිත සසළ කරවන ආකාරයටය.

විවිධ ගති පැවතුම් ඇති කාන්තා චරිත රැසක්

ශ්‍රීනාත් මිද්දුමගේ

හරහා විවිධාකාර අභියෝග වලට ඔවුන් මුහුණ දෙන ආකාරය නිරූපනය කරන්නට ලේඛිකාව උත්සාහ කර ඇති බවක් පෙනී යයි. ඒ චරිත හා සැලි ගේ චරිතය හා සැසඳීමක් කරන්නට පාඨකයාට අවස්ථාවක් ලැබෙන්නේ ඒ ඔස්සේ සැලිගේ චරිතය පිළිබඳ මනා වැටහීමක් ලබාගන්නට ඔවුනට හැකි වන ලෙසටය.

සැලිට හමුවන ශැගී නම් වන ගායිකාව නිසා ඇගේ අන්ධකාර ජීවියට ආලෝකයක් ලැබෙයි.

මේ විශ්ව සාහිත්‍යයේ නවකතාව දම්පාටින් නමින් සිංහලයට නැගීමෙන් ස්වර්ණකාන්ති රාජපක්ෂ ලේඛිකාව කර ඇති සේවය පිළිබඳව අපේ ස්තුතිය ඇයට පිරිනැමිය යුතුමය. මේ කෘතිය සෑම කාන්තාවකම පිරිමියකුම කියවිය යුතු පොතක් යයි මම සිතමි. ජීවිතය පිළිබඳව බොහෝ දේ ඉගෙනගන්නට එයින් ඔවුනට ඉඩ ලැබෙන බව නිසැකය.